“ඔබ මලපහ කිරීමට පැමිණෙන විට, කිබ්ලා දිසාවට මුහුණලා නො සිටින්න. තවද එයට පසුපසලා ද නො සිටින්න. නමුත් නැගෙනහිර දෙසට හෝ බටහිර දෙසට හෝ හැරෙන්න.”

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව අබූ අය්යූබ් අල් අන්සාරි (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී: “ඔබ මලපහ කිරීමට පැමිණෙන
විට, කිබ්ලා දිසාවට මුහුණලා නො සිටින්න. තවද එයට පසුපසලා ද නො සිටින්න. නමුත් නැගෙනහිර දෙසට හෝ බටහිර දෙසට හෝ හැරෙන්න.” අබූ අය්යූබ් තුමා තවදුරටත්: “අපි සිරියාවට පැමිණියෙමු. එහි කඃබා දෙසට මුහුණ ලා තනන ලද වැසිකිළි අපි දුටුවෙමු. එවිට
අපි අපගේ ශරීර කිබ්ලා දිශාවෙන් වෙනතකට හරවා සිටියෙමු. තවද අල්ලාහ්ගෙන් සමාව අයැද සිටියෙමු.” යැයි පැවසීය. [صحيح] [متفق عليه]

කවරෙකු මලපහ කිරීමට හෝ මූත්රා කිරීමට හෝ සිතන්නේ ද ඔහු කඃබා දිශාවෙහි කිබ්ලා දෙසට මුහුණ ලෑම හෝ ඒ දෙසට තම පිටුපස පිහිටන අයුරින් පසුපස ලෑම හෝ නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් තහනම් කළහ. එමෙන්ම ඔහුගේ කිබ්ලාව මදීනා වැසියන්ගේ කිබ්ලා දිශාව මෙන් පිහිටා තිබේ නම්, ඔහු නැගෙනහිර හෝ බටහිර දිශාවට හැරිය යුතු ය. පසුව අබූ අය්යූබ් (රළියල්ලාහු අන්හු) තුමා මෙසේ දන්වා සිටියේය: ඇත්තෙන්ම ඔවුන් සිරියාවට පැමිණි කල්හි, එහි තම අවශ්යතා ඉටු කිරීම සඳහා කඃබා දිශාවට මුහුණ ලා තනන ලද වැසිකිලි දකින්නට විය. එවිට ඔවුහු ඔවුන්ගේ ශරීර කිබ්ලා දිශාවෙන් වෙනතකට හරවා සිටි අතර ඒ සමගම ඔවුහු අල්ලාහ්ගෙන් පාපක්ෂමාව ඉල්ලා සිටියහ.

https://sunnah.global/hadeeth/si/show/3078